සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

43 S I

7 ශ්‍රේණිය | චිත්‍ර කලාව | කාලය පැය 02 යි


නම/ විභාග අංකය: ..........


සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට ඡේදයෙහි සඳහන් උපදෙස් කියවා අදාළ පිළිතුරු සපයන්න.


## I කොටස


- පහත සඳහන් වන්නේ ශ්‍රී ලංකාවේ තන්තිරිමලේ, දොරවක, බිල්ලෑව ආදී ප්‍රදේශවල ප්‍රාග් ඓතිහාසික ගුහාවලින් පිටපත් කරන ලද සිතුවම් කිහිපයකි. එම සිතුවම් හඳුනාගෙන තිත් ඉර මත ලියන්න

01.  ..........

02.  ..........

03.  ..........

04.  ..........

05.  ..........

- **ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

06. සරල හා වියුක්ත හැඩතල යොදා ගනිමින් නිර්මාණය කරන ලද රූප සජීවීකරණයට ලක් කිරීමෙන් කාටුන් නිර්මාණය කරනු ලැබේ. මෙසේ සජීවීකරණය කරනු ලබන්නේ,

    (1) පරිගණක තාක්ෂණය උපයෝගී කරගෙනය.

    (2) නැනෝ තාක්ෂණය උපයෝගී කරගෙනය.

    (3) ලිතෝ මුද්‍රණ තාක්ෂණය උපයෝගී කරගෙනය.

    (4) විවීමේ තාක්ෂණය උපයෝගී කරගෙනය.

07. ජනප්‍රිය කාටුන් වැඩ සටහන තෝරන්න.

    (1) මුල් පිටුව

    (2) දඟර වලිග ලප වානර

    (3) සිංහබාහු

    (4) රස රසි ගී

08. වර්තමානයේ ප්‍රාසාංගික කලාවක් ලෙස වර්ධනය වී ඇති රූකඩ කලාවේ ඉතා ජනප්‍රිය රූකඩ වර්ග 05 ඇතුළත් වරණය තෝරන්න.

    (1) නූල් රූකඩ, සැරසිලි රූකඩ, සත්ත්ව රූකඩ,මල් රූකඩ, රිටි රූකඩ

    (2) සෙවනැලි රූකඩ, ගස් රූකඩ, කුරුළු රූකඩ, රිටි රූකඩ, ගොඩ රූකඩ

    (3) රිටි රූකඩ, තල රූකඩ, රජ රූකඩ, නූල් රූකඩ, තඹ රූකඩ

    (4) අත් රූකඩ, ඇඟිලි රූකඩ, නූල් රූකඩ, සෙවණැලි රූකඩ, රිටි රූකඩ

09. රූකඩ නිර්මාණය සඳහා ලංකාවේ භාවිතා කරන දැව වර්ග

    (1) හල්මිල්ල ලී, නැඳුන් ලී

    (2) පලු ලී, මී ගහේ ලී

    (3) කදුරු ලී, රුක් අත්තන ලී

    (4) වීර ලී, බුරුතලී

10. රූකඩ නාට්‍ය සඳහා බොහෝ විට ගායනා කරනු ලබන්නේ,

    (1) නූර්ති හා නාඩගම් ගීතයි.

    (2) සරල ගීතයි.

    (3) පන්නම් ගීතයි.

    (4) බයිලා ගීතයි.

- ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න සඳහා ස්ථූප සම්බන්ධව දී ඇති වගුවේ **ABCDE** අක්ෂර සහිත හිස්තැනට අදාළ පිළිතුර, ප්‍රශ්න අංකය ඉදිරියෙන් ලියන්න.

| ස්ථූපය | යුගය / කාලය | අනුග්‍රහය | ඓතිහාසික වටිනාකම | හැඩය | උස | ස්ථූප ආශ්‍රිත විශේෂ නිර්මාණ හා කලා ලක්ෂණ |
|---|---|---|---|---|---|---|
| ථූපාරාමය | අනුරාධපුර යුගය (ක්‍රි. පූ. 03) | දේවනම් පියතිස්ස රජතුමා | බුදු රජාණන් වහන්සේගේ දකුණු අකුධාතුව (ග්‍රීවාස්ථිය) තැම්පත් කර ඇත. | A .......... .............. | අඩි 63 | ලජ්ජ තිස්ස රජු විසින් වටදාගෙය නිර්මාණය කර ඇත. |
| රුවන්වැලි මහා සෑය | අනුරාධපුර යුගය | B .......... ................ ................ රජතුමා | බුදු රජාණන් වහන්සේගේ ශාරීරික ධාතු තැම්පත් කර ඇත. | බුබ්බුලාකාර | අඩි 350 | ස්ථූපය සහිත චතුරස්‍රාකාර වේදිකාවේ හතර පස ස්ථූපයේ හැඩය සහිත කුඩා ස්ථූප 04 කි. චෛත්‍යය වටා ඇති ඇත් පවුර<br>• දුටුගැමුණු රජ රූපය<br>• භාතිය තිස්ස රජ රූපය<br>• විහාරමහා දේවී රූපය |
| අභයගිරිය දාගැබ | C .......... ................ ................ ................ | වට්ටගාමිණී අභය (වලගම්බා රජතුමා) | බුදුන්ගේ ශ්‍රී පතුල් සලකුණ මත ඉදිකර ඇත. (පාහියන් හිමිගේ මතය.) | ධාන්‍යාකාර | අඩි 235 | පිවිසුම් දොරටුව සඳකඩපහන,<br>සංඛ නිධි සහ පද්ම නිධි බහිරව රූප සහිත මුරගල කලාත්මක නිර්මාණ වේ. |
| ජේතවන දාගැබ | අනුරාධපුර යුගය (ක්‍රි. ව. 276 - 303) | මහසෙන් රජතුමා | බුදුරජාණන් වහන්සේගේ පටි ධාතුව තැම්පත් කර ඇත. | D .......... ............ | අඩි 400 | දාගැබ වටා වාහල්කඩ 4 කි. වේදිකාවට පිවිසුම් දොරටු 4 කි. |
| කැලණි ස්ථූපය | මුලින් ඉදිකළ ස්ථූපය අනුරාධපුර යුගය | මණිඅක්ඛිත නා රජතුමා | E .............. ............... | ධාන්‍යාකාර | අඩි 90 | චෛත්‍ය හතර පැත්තේ වාහල්කඩ හතරකි. |

11 A - ..........................................................................................

12 B - ..........................................................................................

13. C - ..........................................................................................

14. D - ..........................................................................................

15 E - ..........................................................................................

- **16 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති වාක්‍ය හරිනම් (✓) ලකුණු ද වැරදි නම් (✗) ලකුණ ද වරහන තුළ දමන්න.**

16. රතු, කහ, නිල් යන වර්ණ ප්‍රධාන වර්ණ ලෙස හැඳින්වේ. (..............)

17. නිල් වර්ණය සමඟ කහ වර්ණය මිශ්‍ර වීමෙන් දම් වර්ණය සෑදේ. (..............)

18. කඩදාසි කැබලි එකතු කරමින් අලවා සකස් කරන සිතුවම් කොලාජ් සිතුවම් ලෙස හැඳින්වේ. (..............)

19. මොනෝක්‍රෝම් සිතුවම් යනු, එකම වර්ණයේ ප්‍රභේද වලින් අඳිනු ලබන සිතුවම් වේ. (..............)

20. ග්‍රැෆික් මුද්‍රණ මාධ්‍යයෙන් පොත් පිට කරවයක් නිර්මාණය කළ නොහැක. (..............)

(ල. 2 × 20 = 40)

## II කොටස

- ඇන්තූරියම් පැලයක් දැමූ මැටිකලය සහ සනකය පැන්සලෙන් ඇඳ වර්ණ කරන්න.

## III කොටස

- පහත සඳහන් මාතෘකා අතුරින් එක් මාතෘකාවක් තෝරාගෙන චිත්‍රයක් ඇඳ වර්ණ කරන්න.

(1) නිදහසේ සැරිසරන වන සතුන්

(2) දිය නාන මිනිසුන් පිරිසක්

(3) අභය භූමියක් නරඹන ජනයා

(4) බුමුතුරුණකට, කුෂන් කවරයකට හෝ මේස රෙද්දකට මුළු තල මෝස්තරයක්

(5) මල් සහ කොළ භාවිතාකර චීත්ත රෙද්දකට ව්‍යාප්ත මෝස්තරයක්

(6) පාසලේ පවත්වන ''සාහිත්‍ය උළෙල සඳහා දැන්වීමක්

## පිළිතුරු පත්‍රය - I කොටස

01. දුනුවායා 02. මිනිස් සහ සත්ව රුව සිතුවම 03. ඇතා සහ පැටවා සිතුවම
04. මොල්ලිය සහිත ගව රුව සිතුවම
05. මිනිස් රූප සම්පින්ඩනය / කොටුවක් තුළ මිනිස් රුව / නිවසක් තුළ මිනිස් රුව
06. (1) පරිගණක තාක්ෂණය උපයෝගි කරගෙන
07. (2) දඟර වලිග ලප වානර
08. (4) අත් රැකඩ, ඇඟිලි රැකඩ, නූල් රැකඩ, සෙවණැලි රැකඩ, රිටි රැකඩ
09. (3) කඳුරු ලී, රුක් අත්තන ලී 10. (1) නූර්ති හා නාඩගම් ගීතයි.
11. A - ඝණ්ඨාකාර හැඩය 12. B - දුටුගැමුණු රජතුමා 13. C - අනුරාධපුර යුගය
14. D - ධාන්‍යාකාර හැඩය
15. E - බුදුන් වහන්සේ ධර්ම දේශනා කරන ලද මිණිපළඟ (ආසනය) තැම්පත් කර ඇත.
16. ✓ 17. ✗ 18. ✓ 19. ✓ 20. ✗

(ල. 2 × 20 = 40)

## II - කොටස

01. ගති ලක්ෂණ හා ත්‍රිමාණ ලක්ෂණ පෙන්වා පැන්සලෙන් වර්ණ කර ඇත්නම් ලකුණු දෙන්න. (ල. 20)

## III - කොටස

- ලකුණු දීමේ නිර්ණායක

<u>ප්‍රකාශන චිත්‍ර</u>

(1) තෝරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේ දී ඊට උචිත වාතාවරණය ප්‍රකාශ කර ඇති අයුරුව.
(2) මානව රූප හා සත්ව රූ ඇතුළු සියලු හැඩතල තලය මත සම්පිණ්ඩනය කර ඇති අයුරු.
(3) සිද්ධාන්ත භාවිතය (ත්‍රිමාණ ලක්ෂණ, පර්යාවලෝකය, පරිමානය)
(4) වර්ණ භාවිතයේ කුසලතා දැක්වීම.
(5) අනුගමනය කර ඇති ශෛලිය සහ සමස්ත නිමාව.

(ල. 5 × 8 = 40)

<u>මොස්තර චිත්‍ර</u>

(1) මතෘකාවට අදාළව නවතාවයකින් යුතුව සැලසුම් කිරීම.
(2) පරිහාරික අවශ්‍යතාවයන්ට ගැළපෙන බව හා කර්මාන්තයට උචිත බව.
(3) රේඛා හැඩතල අර්ථවත්ව යොදා ගැනීමේ හැකියාව.
(4) උචිත වර්ණ තෝරාගැනීමේ හා භාවිතයේ හැකියාව.
(5) විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය.

(ල. 5 × 8 = 40)

<u>ග්‍රැෆික් චිත්‍ර</u>

(1) මාතෘකාවට උචිත ලෙස නවතාවයකින් සැලසුම් කිරීමේ හැකියාව
(2) වානිජමය අවශ්‍යතාවයන්ට හා මුද්‍රණයට උචිත බව.
(3) රේඛා හැඩතල අර්ථවත්ව යොදාගැනීමේ හැකියාව.
(4) උචිත වර්ණ තෝරාගැනීමේ හා භාවිත කිරීමේ හැකියාව.
(5) විචිත්‍රත්වය, චමත්කාර හා නිර්මාණයේ සාර්ථකත්වය.

(ල. 5 × 8 = 40)